# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1878/11 - 2014 සැප්තැම්බර් මස 01 වැනි සඳුදා - 2014.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2012.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ), (ක) සහ (ඍ) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2014 මසුන් ඇල්ලීම පිළිබඳ දත්ත රැස් කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ මසුන් ඇල්ලීම පිළිබඳ 1980 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 109 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ නියෝග යටතේ ලියාපදිංචි වී ඇති යම් යාන්ත්‍රික ධීවර බෝට්ටුවක් භාවිත කරන සෑම තැනැත්තකුම, එක් එක් මසුන් ඇල්ලීමේ වාරයක දී ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලොග් සටහන් පොතක් එම බෝට්ටුවෙහි තබා ගත යුතු ය.

3. (1) මේ නියෝග ප්‍රකාරව මසුන් ඇල්ලීමෙහි යෙදී සිටින සෑම තැනැත්තකු විසින් ම එක් එක් මසුන් ඇල්ලීමේ වාරයකට අදාළව, අල්ලන ලද මසුන් පිළිබඳ ලොග් සටහන් පොතෙහි වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

(2) යම් බලයලත් නිලධරයකු විසින් නියම කරනු ලබන්නේ නම්, එම බලයලත් නිලධාරයා වෙත අධීක්ෂණය සඳහා ලොග් සටහන් පොත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. (1) මේ නියෝග ප්‍රකාරව මසුන් ඇල්ලීමෙහි නිරතව සිටින සෑම තැනැත්තකු විසින් ම, බලයලත් නිලධාරයා වෙත ලොග් සටහන් පොත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම මාස තුනක් අවසානයේ දී ම, බලයලත් නිලධාරයා විසින් එම ලොග් සටහන් පොත පරීක්ෂා කර සහතික කරනු ලැබිය යුතු ය.

5. අපනයනය සඳහා මසුන් සපයනු ලබන ධීවර බෝට්ටුවක සෑම අයිතිකරුවකු ම, කපිතාන්වරයකු ම, නියමුවක ම හෝ ක්‍රියාකරුවකු ම විසින් තමා විසින් අල්ලනු ලැබූ මසුන් පිළිබඳ විස්තර ඇතුළත් මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අවස්ථාවෝචිත පරිදි "අ" හෝ "ආ" ආකෘතියට සාරානුකූලව සහතික පත්‍රයක් නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. (1) ප්‍රති අපනයනය සඳහා මසුන් ආනයනය කරනු ලබන සෑම ආනයනකරුවකු ම, ප්‍රති අපනයනය සඳහා ආනයනය කරනු ලබන එම මසුන් අපනයනය කිරීම සිදු කරන රටෙහි අදාළ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන යථා පරිදි අත්සන් කරන ලද මසුන් ඇල්ලීමේ සහතිකයක් සහ ආශ්‍රිත ලේඛන ද, ආහාර ස්වස්ථාතා තත්වයන්ට එම මත්ස්‍ය නිෂ්පාදන අනුකූල වන බවට වූ සහතිකයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම නියෝගවල II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම සිදු කරනු ලබන රටෙහි අධිකාරියෙන්, එම නිෂ්පාදනවලට අදාළ සැකසුම් ප්‍රකාශයක් ලබා ගත යුතු ය.

7. (1) මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම නිසි බලධරයාගෙන් වලංගු මසුන් ඇල්ලීමේ සහතිකය, ආශ්‍රිත ලේඛනය සහ සෞඛ්‍ය සහතිකයක් ලබා ගත යුතු ය.

(2) එසේ අපනයනය කරනු ලබන මත්ෂ්‍ය නිෂ්පාදන 1998 සැප්තැම්බර් මස 14 වැනි දින අංක 1045/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1998 මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) නියෝගවල සඳහන් නියමයන් සපුරාලනු ලැබිය යුතු ය.

8. 2012 අප්‍රේල් මස 25 වැනි දින අංක 1755/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2012 මසුන් ඇල්ලීම පිළිබඳ දත්ත රැස් කිරීමේ නියෝග, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

9. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස -

"බලයලත් නිලධරයා" යන්නෙන් ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 46 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධරයකු අදහස් වේ ;

"නිසි බලධරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ධීවර හ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

"සෞඛ්‍ය සහතිකය" යන්නෙන් මූලික නිෂ්පාදනයේ දී, මෙහෙවීමේ දී, සකස් කිරීමේ දී, ඇසුරුම් කිරීමේ දී සහ එම නිෂ්පාදන හඳුනා ගැනීමේ කාලය තුළ දී මිනිස් පරිභෝජනය සඳහා අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය හා සෞඛ්‍යාරක්ෂික බව පිළිබඳ ප්‍රමිතිය සහතික කරනු ලබන නිල ලේඛනයක් වේ ;

"විශාල බෝට්ටුව" යන්නෙන් -

(අ) ඇදගෙන යාමේ ආම්පන්න සහිත මීටර් 12කට වැඩි සමස්ත දිග ප්‍රමාණයකින් යුතු වූ ;

(ආ) උපරිම ව්‍යුහයකින් යුතු වූ ; හෝ

(ඇ) පැටවිය හැකි දළ ප්‍රමාණය ටොන් 20කට වැඩි වූ ;

බෝට්ටුවක් අදහස් වේ

"කුඩා බෝට්ටුව"යන්නෙන්

(අ) ඇදගෙන යාමේ ආම්පන්න රහිත මීටර් 12කට අඩු සමස්ථ දිග ප්‍රමාණයකින් යුතු වූ ;

(ආ) උපරිම ව්‍යුහයක් රහිත ; හෝ

(ඇ) පැටවිය හැකි දළ ප්‍රමාණය ටොන් 20කට අඩු වූ ;

බෝට්ටුවක් අදහස් වේ.

## I වැනි උපලේඛනය

*"අ" ආකෘතිය*

| විශාල බෝට්ටු සඳහා වූ මසුන් ඇල්ලීමේ සහතිකය | |
|---|---|
| ලේඛන අංකය | වලංගු අධිකාරිය |

| | | |
|---|---|---|
| 1. නම | ලිපිනය | දුරකථන අංකය :-<br>ෆැක්ස් අංකය :- |

| | | | |
|---|---|---|---|
| 2. ධීවර බෝට්ටුවේ නම | ධජය-දේශීය වරාය සහ ලියාපදිංචි අංකය | කැඳවුම් සංඥාව | IMO/ලොයිඩ්ස් අංකය (නිකුත් කර ඇත්නම්) |

| | |
|---|---|
| මසුන් ඇල්ලීමේ බලපත්‍ර අංකය .....................<br><br>වලංගු වන කාලය | ඉන්මාසැට් අංකය, ටෙලිෆැක්ස් අංකය, දුරකථන අංකය, ඊමේල් ලිපිනය (නිකුත් කර ඇත්නම්) |

| | | |
|---|---|---|
| 3. නිෂ්පාදන විස්තරය | බෝට්ටුවෙහි අවසරලත් සැකසුම් ක්‍රමය | 4. සංරක්ෂණය සහ කළමනාකරණ කටයුතු සඳහා අදාළ වන පියවර |

| විශේෂය | නිෂ්පාදන කේත අංකය | මසුන් ඇල්ලීමේ ප්‍රදේශය (ප්‍රදේශ) සහ දින | ඇස්තමේන්තුගත සජීවී බර (කි. ග්‍රෑ.) | නිකුත් කිරීමේ ඇස්මේන්තුගත බර (කි. ග්‍රෑ.) | අදාළ අවස්ථාවලදී ගොඩබාන ලද මසුන්ගේ සහතික කරන ලද බර (කි. ග්‍රෑ.) |
|---|---|---|---|---|---|
| | | | | | |

| |
|---|
| 5. ධීවර බෝට්ටුවේ ප්‍රධානියාගේ නම - අත්සන - මුද්‍රාව : |

| | | | |
|---|---|---|---|
| 6. මුහුදේදී ප්‍රති නැව්ගත කිරීමේ විස්තර, ධීවර බෝට්ටුවේ ප්‍රධානියාගේ නම | අත්සන සහ දිනය | අන්තර් නැව්ගත කිරීමේ දිනය/ප්‍රදේශය/තත්වය | ඇස්තමේන්තුගත බර (කි. ග්‍රෑ.) |

| ලබා ගන්නා බෝට්ටුවේ ප්‍රධානියාගේ නම | අත්සන | බෝට්ටුවේ නම | කැඳවුම් සංඥාව | IMO/ලොයිඩ්ස් අංකය (නිකුත් කර ඇත්නම්) |
|---|---|---|---|---|

7. වරාය ප්‍රදේශයක් ඇතුළත අන්තර් ප්‍රතිනැව්ගත කිරීම් සඳහා බලය ලබා දීම :

| නම | අධිකාරිය | අත්සන | ලිපිනය | දුරකථන | ගොඩබෑ වරාය | ගොඩබෑ දිනය | මුද්‍රාව (රබර් මුද්‍රාව) |
|---|---|---|---|---|---|---|---|

| 8. අපනයනකරුගේ නම සහ ලිපිනය | අත්සන | දිනය | මුද්‍රාව |
|---|---|---|---|

9. ධජය හිමි රටෙහි අධිකාරියේ සතොස්ක්ෂණය :

| නම/පදවිය | අත්සන | දිනය | මුද්‍රාව (සළකුණ) |
|---|---|---|---|

10. ප්‍රවාහන විස්තරය : පරිශිෂ්ඨය බලන්න

11. ආනයනකරුගේ ප්‍රකාශය :

| ආනයනකරුගේ නම සහ ලිපිනය | අත්සන | දිනය | මුද්‍රාව | නිෂ්පාදන සී. එන්. කේතය |
|---|---|---|---|---|
| (යු. කො.) ලියාපදිංචි කිරීමේ 14(1)(2) වගන්ති යටතේ ප්‍රකාශනය | යොමු කිරීම් | | | |
| 12. ආනයන පාලන අධිකාරිය | ස්ථානය | ආනයනය සඳහා බලය පවරන ලදී * | ආනයනය අත්හිටුවන ලදී * | සහතික කිරීම ඉල්ලුම් කරනු ලැබූ දිනය |

| රේගු ප්‍රකාශනය (නිකුත් කර ඇත්නම්) | අංකය | දිනය | ස්ථානය |
|---|---|---|---|

(*) උචිත පරිදි හරි ලකුණ දමන්න

*"ආ" ආකෘතිය*

| කුඩා බෝට්ටු සඳහා වූ මසුන් ඇල්ලීමේ සහතිකය | |
|---|---|
| ලේඛන අංකය | සත්‍යක්ෂණය කිරීමේ බලධරයා (නම, ලිපිනය, දුකරථන, ෆැක්ස්) |
| 1. නිෂ්පාදන විස්තරය | 2. සංරක්ෂණ සහ කළමනාකරණ කටයුතු සඳහා අදාළ වන පියවර පිළිබඳ සටහන් |

| විශේෂය | නිෂ්පාදන කේත අංකය | අදාළ අවස්ථාවන් හි දී ගොඩ බෑ මසුන්ගේ සහතික කරන ලද බර (කි. ග්‍රෑ.) |
|---|---|---|
| | | |

| 3. සෑම බෝට්ටුවක්ම අල්ලන ලද මසුන් ප්‍රමාණයන් සපයන ලද බෝට්ටුවල විස්තර (නම, ලියාපදිංචි අංකය යනාදිය) |
|---|
| |

| 4. අපනයනකරුගේ විස්තර, නම සහ ලිපිනය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | අත්සන | දිනය | මුද්‍රාව |
|---|---|---|---|---|---|
| | | | | | |

| 5. ධජය සහිත රාජ්‍යයේ වලංගු සහතිකය : | | | |
|---|---|---|---|
| නම/පදවිය | අත්සන | දිනය | නිල මුද්‍රාව (රබර් මුද්‍රාව) |

| 6. ප්‍රවාහන විස්තර : (පරිශිෂ්ඨය බලන්න) : |
|---|
| 7. ආනයනකරුගේ ප්‍රකාශනය : |

| ආනයනකරුගේ නම සහ ලිපිනය | අත්සන | දිනය | නිල මුද්‍රාව (රබර් මුද්‍රාව) | නිෂ්පාදන සී. එන්. අංකය |
|---|---|---|---|---|
| 8. ආනයන පාලක අධිකාරිය | ස්ථානය | ආනයනය සඳහා අවසරය දෙන ලදී * | ආනයනය අත්හිටුවන ලදී * | සහතික කිරීම ඉල්ලුම් කරනු ලැබූ දිනය |
| රේගු ප්‍රකාශනය (නිකුත් කර ඇත්නම්) | අංකය | දිනය | ස්ථානය | |

(*) උචිත පරිදි හරි ලකුණ දමන්න

## II වැනි උපලේඛනය

*නීත්‍යානුකූල නොවන, වාර්තා නොවන සහ විධිමත් නොවන මසුන් ඇල්ලීම වැළැක්වීම, නතර කිරීම සහ පිටු දැකීම සඳහා වූ සැකසීමේ ප්‍රකාශ*

පහත දැක්වෙන මසුන් ඇල්ලීමේ සහතිකය (සහතික) යටතේ ආනයනය කරන ලද මසුන්ගෙන් සකස් කරන ලද නිෂ්පාදන ................... (නිෂ්පාදන විස්තර සහ සංයෝග කරන ලද නාම ලේබන සංකේත) ලබාගෙන ඇති බව මම සහතික කර සිටිමි.

| මසුන් ඇල්ලීමේ සහතිකයේ අංකය | බෝට්ටුවේ නම (නම්) සහ ධජය (ධජ) | සත්‍යාක්ෂණ දිනය (දින) | අල්ලන ලද මසුන් පිළිබඳ විස්තරය | ගොඩබෑ සම්පූර්ණ මසුන් ප්‍රමාණයේ බර (කි. ග්‍රෑ.) | අල්ලන ලද මසුන්ගෙන් සකසන ලද ප්‍රමාණය (කි. ග්‍රෑ.) | සකස් කරන ලද මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය (කි. ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

සැකසුම් ආයතනයේ නම සහ ලිපිනය :

අපනයනකරුගේ නම සහ ලිපිනය (සැකසුම් ආයතනයෙන් වෙනස් වේ නම්)

සැකසුම් ආයතනයේ අනුමත අංකය :

සෞඛ්‍ය සහතිකයේ අංකය සහ දිනය :

| සැකසුම් ආයතනයේ වගකිව යුතු තැනැත්තා | අත්සන : | දිනය : | ස්ථානය : |
|---|---|---|---|

නිසි බලධරයාගේ පිටසන :

| නිලය : | අත්සන සහ මුද්‍රාව : | දිනය : | ස්ථානය : |
|---|---|---|---|

09-532

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.